# සංචාරක කර්මාන්ත අලෙවිකරණය තුළ පවත්නා දුර්වලතා මගහරවා ගනිමින් ප්‍රශස්ත ආදායම් ඉපයීමක් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක අලෙවිකරණ ප්‍රතිපත්ති සකස් කරගත යුතු ආකාරය පිළිබඳව අධ්‍යනයක්

ආර්. පී.ඒ.එස්. බාලසූරිය, කේ.කේ.පී.එම්.ජයතිලක*

ශ්‍රී ලංකාව ඉතා දිගු සංචරණ ඉතිහාසයක් සහිත ආසියාතික රටකි. ඈත අතීතයේ පටන් ම පෙර අපර දෙදිග ජාතීන් ශ්‍රී ලංකාවට විවිධ හේතූන් මත පැමිණ තිබේ. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට හා විදේශ විනිමය මෙරටට ගෙන ඒමට සැලකිය යුතු මට්ටමේ දායකත්වයක් මෙම සංචාරක කර්මාන්තය තුළින් ලබා දෙනු ලැබේ. වර්තමාන සංචාරක කර්මාන්තය හරහා ශ්‍රී ලංකාව වාර්ෂිකව විශාල ආදායමක් උපයන නමුදු කණගාටුදායක ලෙස විශාල ආදායමක් නැවත ප්‍රතිකාන්දු වීම සිදු වන වේගය අලෙවිකරණය හා ඍජුව බද්ධ වී ඇති සංචාරක කර්මාන්තය නිසි අලෙවි කළමනාකරණයකින් තොරව පවත්වාගෙන යාම කළ නොහැක. ශ්‍රී ලංකාව තුළ සැලසුම් සහගත අලෙවිකරණ ක්‍රියාවලියක් නොමැති වීම නිසා සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ලාභය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත.

මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාව තුළ සංචාරක අලෙවිකරණ ක්ෂේත්‍රය තුළ දක්නට ලැබෙන දුර්වලතා හා ඌනතා හඳුන්වා දී ඒවාට යෙදිය යුතු පිළියම් පිළිබඳව සාකච්ඡා කිරීමටත්, දේශීය අලෙවිකරණ ප්‍රතිපත්තියක් තුළින් රටට හා රටේ සංවර්ධනයට සංචාරක ක්ෂේත්‍රයෙන් ඵලදායී ලෙස ආදායම් උපදවා ගැනීම පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමටත් ය. මෙහිදී තෝරාගත් ද්විතීක මූලාශ්‍ර පරිහරණය, සම්මුඛ සාකච්ඡා, තෝරාගත් සංචාරක නිෂ්පාදන අලෙවි ක්‍රියාවලි හා න්‍යායන් අධ්‍යයනය කොට පවතින ගැටළුකාරී තත්ත්වය විමර්ශනය කර ඒ සඳහා සුදුසු විසඳුම් ඉදිරිපත් කිරීමට යෝජනා කිරීමට ය. එමෙන් ම අලෙවිකරණය දේශීයකරණය කළ යුතු ආකාරය හා ශ්‍රී ලංකාවට උචිත ලෙස අලෙවිකරණ ක්‍රියාවලිය යොදාගත යුතු ආකාරය පිළිබඳව නව මත හා යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

මුඛ්‍ය පද - සංචාරක කර්මාන්තය, සංචාරක අලෙවිකරණය, ආදායම් ප්‍රතිකාන්දුව, අලෙවිකරණ න්‍යායන් හා ප්‍රතිපත්ති

* balasuriyaanuradha@gmail.com / pavanimadarajayathilaka@gmail.com